# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1607/13 - 2009 ජුනි 23 වැනි අඟහරුවාදා - 2009.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින්, (2007 ඔක්තෝබර් මස 18 වැනි දින අංක 1519/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සළකනු ලැබිය යුතු සහ කැළණිය විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ, I වැනි තීරයේ දැක්වෙන "වෛද්‍ය විද්‍යා පීඨයට" අනුරූපව :—

(1) එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන 5 වන අයිතමය ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"5. වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය." ; සහ

(2) එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන 15 වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"16. ආබාධිතතා අධ්‍යයන අංශය.".

මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2009 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

07-234

1A - G 011312 — 935 (2009/06)